Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 07 - 2023

# නර්තනය

කාලය පැය 2

නම / විභාග අංකය:

## I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. කොහොඹා කංකාරි ශාන්තිකර්මය මුලින්ම පවත්වන ලද්දේ,
    (i) සේරමාන් රජුටය (ii) මලය රජුටය
    (iii) පඬුවස්දෙව් රජුටය (iv) විජය රජුටය

02. ''පුටුව සරසලයි මම සැලකරන්නේ'' යන කවිය අයත් වන්නේ,
    (i) මල් යහන් කවි වලටය (ii) තලමලවරුණ කවි වලටය
    (iii) කුළු කවි වලටය (iv) ග්‍රහපත්ති කවි වලටය

03. උත්සාහය නැමැති භාවයෙන් නිරූපනය වන රසය වන්නේ,
    (i) අද්භූත රසයයි (ii) වීර රසයයි
    (iii) ශාන්ත රසයයි (iv) භයානක රසයයි

04. 6 වන පා සරඹයේ සරඹ නාමය වන්නේ,
    (i) අඩිය (ii) දැල අඩිය
    (iii) දැඩිය (iv) පසුපෙර අඩිය

05. වෙසක් කැකුළු අතු අග ඉද නටන විලාසේ ... ගීතයේ පද රචනය කරණු ලැබුවේ,
    (i) සුනිල් ශාන්ත මහතා (ii) ඩබ්. ඩී. අමරදේව මහතා
    (iii) සුනිල් එදිරිසිංහ මහතා (iv) මර්සලින් ජයකොඩි පියතුමා

- අංක 06-10 තෙක් ඇති ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති ඉතා නිවැරදි පිළිතුර තෝරා හිස් තැන් පුරවන්න.

(දවුල, විනෝදාර්ථය, දැඩි භක්තිය, තලමල පිපීම, පහත රට)

06. ගිනි පැගීම, බිම පෙරළීම, කටු ගැසීම ආදී දුෂ්කර ක්‍රියාවන්වල යෙදෙන්නේ දෙවියන් වෙනුවෙන් ..................................................... ප්‍රකාශ කිරීම සඳහාය.
07. පණිවිඩයක් සන්නිවේදනය කිරීම සඳහා ..................................................... භාවිතා කරයි.
08. සබරගමු වන්නම් ..................................................... අරමුණු කොටගෙන රචනා වී ඇත.
09. තෙල්මේ නර්තනය ..................................................... සම්ප්‍රදායේ එන ශාස්ත්‍රීය නර්තන අංගයකි.
10. ගමකට අසුබ වූ කාරණයක් ලෙස සලකනු ලබන්නේ ..................................................... .

- ප්‍රශ්න අංක 11-15 තෙක් ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණද වැරදි නම් (✕) ලකුණද යොදන්න.

11. වැස්ස තේමා කරගත් නිර්මාණ ගොඩනැගීමේ ක්‍රියාකාරකම විකල්ප වාද්‍ය භාණ්ඩ වලින් කළ හැක. (     )
12. මාරි අම්මාන් හා ගංගා අම්මාන් දෙවිවරු කරගම් නැටුමේ පුද ලබයි. (     )
13. රාමසාන් උත්සවය හින්දු බැතිමතුන්ගේ උත්සවයකි. (     )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

14. වන්නමක අවසානයේ අඩව්ව නැටීමට පෙර නටනු ලබන පද කොටස කස්තිරම වේ. ( )

15. නර්තනය තුළින් ශරීර සෞඛ්‍ය යහපත් ලෙස පවත්වා ගත හැකි වේ. ( )

● **අංක 16-20 තෙක් ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පද දෙක තෝරා A හා B කාණ්ඩ යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16. | රත්නවල්ලි කවි | බංඩාර දෙවි |
| 17. | ජේ. ඊ. සේදරමන් මහතා | කුළු නැටුම |
| 18. | කොහොඹා කංකාරිය | උඩරට නැටුම් |
| 19. | රද්දැල්ලේ පොඩි මහත්තයා | තුරඟා වන්නම |
| 20. | කන්ථක අශ්වයා | සබරගමු සම්ප්‍රදාය |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# නර්තනය - 7 ශ්‍රේණිය

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් දෙකකට පිළිතුරු සපයන්න.**

01. (i) දෙං ජිංත ගත දොංත යන බෙර පදය අදාල තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න.
(ii) කොහොඹා කංකාරිය මුලින්ම පැවැත්වූයේ කොහේදීද? කවුරුන් උදෙසාද?
(iii) කතරගම පෙරහැර සඳහා සිටුවන ලද කප පූජා වස්තුවක් ලෙස සලකණු ලබන්නේ ඇයි?
(iv) ''ශුද්ධවූ අල් කුර් ආනය'' ලොව පහළ වූ කාලය සිහිපත් කිරීම සඳහා පවත්වනු ලබන උත්සවය කුමක්ද?
(v) පෙරහැරේ දේවාභරණ ගෙනයන ඇතුගේ පිටඋඩ වස්ත්‍ර ඇතිරීම හඳුන්වන නම කුමක්ද?

02. **උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන් ත්‍රිත්වය තුළ කල එළි බැසීමේ අවස්ථාව දැකිය හැකිය.**
(i) සම්ප්‍රදායන් තුනෙහි කලඑළි මංගල්‍ය හඳුන්වන අවස්ථාව නාමිකව ලියා දක්වන්න.
- උඩරට -
- පහතරට -
- සබරගමු -

(ii) පහතරට කලඑළි මංගල්‍යයේ එන චාරිත්‍ර විධි 2 ක් හඳුන්වන්න.
(iii) උඩරට නර්තන සම්ප්‍රදායේ කලඑළි මංගල්‍ය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

03. **වගුවෙහි ඇති හිස්තැන්වලට අදාලව පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| සම්ප්‍රදාය | ශාන්තිකර්ම | නර්තන අංග හා නාට්‍යමය අංග | පැවැත්වීමේ හේතු (අතීත) |
|---|---|---|---|
| උඩරට | i. | i. යක් ඇනුම<br>ii. ..................................... | |
| පහතරට | ii. | i. තෙල්මේ<br>ii. ..................................... | |
| සබරගමු | iii. | i. ....................................<br>ii. රාමායක්කම | |

(i) සම්ප්‍රදායන් තුනට අදාල ප්‍රධාන ශාන්තිකර්ම නම් කරන්න.
(ii) ඒ ඒ සම්ප්‍රදායට අයත් නර්තන අංගයක් හෝ නාට්‍යමය අවස්ථාවක් හිස්තැනට අදාලව නම් කරන්න.
(iii) ශාන්තිකර්ම පැවැත්වීමේ අතීත හේතු ලියා දක්වන්න.

04. **පහත දී ඇති මාතෘකා වලින් 02ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.**
(i) ගැමි නැටුම
(ii) නම්‍යතා අභ්‍යාස
(iii) එම්. එච්. ගෝමිස්හාමි
(iv) කතරගම පෙරහැර

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**05. කෘෂි කර්මාන්තය පදනම් කර ගනිමින් ගැමි නැටුම් නිර්මාණය වී ඇත.**

(i) ලෙළ දෙමිනේ මල උඩු ගුවනේ ... යන තලමල වරුණ ගායනයේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

(ii) ජන ගායනා වල සුවිශේෂී ලක්ෂණ 03 ක් ලියන්න.

(iii) කුළු නැටුමක් සාමුහිකව නිර්මාණය කිරීමේ දී අවකාශ භාවිතා කරමින් රංගරටා ගොඩනඟන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තුන්වන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## නර්තනය

**ප්‍රායෝගික පරීක්ෂණය**

1. (i) කැමති ගායනය (ල. 5)

 (ii) නම් කළ ගායනය
 (කුළු, තාලම්, මල්යහන්, තලමල වරුණ) (ල. 5)

02. (i) ගොඩ සරඹ 3 හෝ 4 නර්තනය (ල. 5)

 (ii) කස්තිරම නර්තනය (ල. 5)

03. (i) හනුමා වන්නම හෝ තුරඟා වන්නම නර්තනය (ල. 5)

 (ii) කස්තිරම, සීරුමාරුව, අඩව්ව (ල. 5)

04. ගැමි නැටුම නර්තනය (කුළු හෝ තාලම්) (ල. 10)

05. නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි සත්ව චරිතයක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. (ල. 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තුන්වන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## නර්තනය

පිළිතුරු පත්‍රය

### I කොටස

01. (iii)
02. (iv)
03. (ii)
04. (iv)
05. (i)
06. දැඩි භක්තිය
07. දවුල
08. විනෝදාර්ථය
09. පහතරට
10. තලමල පිපීම

(ල. 2×20=40)

11. ✓
12. ✓
13. ✗
14. ✗
15. ✓
16. කුළු නැටුම
17. උඩරට නැටුම
18. බංඩාරදෙවි
19. සබරගමු සම්ප්‍රදාය
20. තුරඟා වන්නම

### II කොටස

01. (i)

| ∧ | | / | | | ∧ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දොං | - | ප්‍රිං | - | ත | ග | ත | ද්‍රොං | - | ත |

(ii) මහමෙව්නා උයනේ / පඬුවස්දෙව් රජුට

(iii) පරහැර පවත්වනු ලබන මුළුකාලය තුළම කතරගම දෙවියන් එම කපෙහි වාසය කරන බවට විශ්වාස කිරීම නිසා

(iv) රාමලාන් / රාමසාන්

(v) වත බැඳීම (ල. 2×5=10)

02. (i) උඩරට - හිස වෙස් තැබීමේ මංගල්‍ය / ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍ය

පහතරට - මඩු බැසීමේ මංගල්‍ය

සබරගමු - ගුරු වරම්දීමේ මංගල්‍ය (ල. 03)

(ii) පහතරට කලඑළි මංගල්‍ය චාරිත්‍ර

- ⋆ මඩු බසින ආධුනිකයා කපු පත්තිනි අයෙක් නම් හලං වැඩමවා පත්තිනි නැටීම සිදුකරන බව
- ⋆ ගුරු පඬුරු හා තෑගි බෝග ප්‍රදානය කරන බව

ආදී ලෙස අදාලව කරුණු දක්වා ඇත්නම් (ල. 03)

(iii) උඩරට කලඑළි මංග්‍යය

- ⋆ දින 07 ක් ආධුනිකයා විහාරස්ථානයේ ආගමික වතාවත්වල යෙදෙන බව
- ⋆ දෙවි දේවතාවුන්ට පහන් දල්වා ආශිර්වාද ලබා ගන්නා බව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

★ පෙරදින රාත්‍රී හඟල ඇතුළු රංග වස්ත්‍රාභරණ පේ කර බෝධි පූජාවක් පවත්වන ලද බව

★ පසු දින සෙත් පිරිත් ගායනා මැද විහාරස්ථානය තුළ හිසවෙස් පැළඳ වීම සිදු කරන බව

★ හිස වහන්තරාව ඉවත් කිරීමෙන් පසු ගුරු පා නැමැද මංගලම් නර්තනය කරන බව

ආදි ලෙස අදාලව කරුණු (ල. 04)

03. (i) උඩරට - කොහොඹා කංකාරිය

පහතරට - දෙවොල් මඩුව

සබරගමු - පහන් මඩුව (ල.5×2
03)

(ii) උඩරට - යක්කම්, ගුරුගේ මාලාව, ගබඩා කොල්ලය ආදියෙන් 1 ක්

පහතරට - අඬ විදමන, දෙවොල් ගොඩ බැසීම, ඇත්බන්ධනය ආදියෙන් 1 ක්

සබරගමු - දේවකෝල් පාඩුව, මුදුන් තාලය, යහන් දැක්ම, මල්පද ආදියෙන් 1 ක් (ල. 03)

(iii) **අතීත හේතුව**

උඩරට - පඬුවස්දෙව් රජතුමාගේ දිවිදෝෂය දුරු කිරීමට

පහතරට } - සේරමාන් රජතුමාගේ නින්දට බාධා කළ ගෝනෙකු මැරීමෙන් පලිගැනීමට සිතාගත් ගෝනා

සබරගමු මැඩියකු ලෙස ඉපිද රජතුමාගෙන් පලිගත් බවත් හිස රදයක් සෑදීම නිසා එය සුව කිරීමට එය කළ බවත් (ල. 04)

04. ★ මාතෘකා දෙකකට අදාලව කෙටි සටහන් ලියා ඇත්නම් (ල. 5×2=10)

05. (i) ලෙළ දෙමිනේ මල ... යන කවිය සම්පූර්ණයෙන් ලියා ඇත්නම් (ල. 03)

(ii) ජන ගායනා වල සුවිශේෂී ලක්ෂණ 03ක් ලියා ඇත්නම් (ල. 03)

(iii) කුළු නැටුමක් නිර්මාණය සාමූහිකව කිරීමේදී රංග රටා ගොඩ නඟන ආකාරය දක්වා ඇත්නම් (ල. 04)